# ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව

අංක : 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
දුරකථනය : 2863705 / 2868002 / 2867533 / 867369 / ෆැක්ස් 2866896

## ඉඩමක් සංවර්ධනය කරගැනීම අයදුම්කිරීම සඳහා උපදෙස්

ඉඩමේ අයිතිකරු විසින් මේ සමඟ ඇති අයදුම්පත් (පිටපත් 02 කින්) නිසියාකාරව සම්පූර්ණ කර අදාල ඉඩමේ පිඹුරුපතෙහි ඡායා පිටපත් 03 ක් සහ ඔප්පුවේ පැහැදිලි ඡායා පිටපත් 01 ක් ද, සමඟ අපවෙත ඉදිරිපත් කළ යුතුය.

සංවර්ධනය කිරීමට අවශ්‍යව ඇති ඉඩම් දැනට වගා කෙරෙන හෝ පාලුවට හැර තිබෙන කුඹුරු ඉඩමක් නම්, (ඔප්පුවේ ඉඩමේ නම අගට කඹුර, ඕවිට, දෙනිය, වෙල ලෙස සදහන්ව ඇති නම්) අදාල අයදුම්පත මෙම සංස්ථාවට ඉදිරිපත් කිරීමට පෙර, ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතට ඉල්ලීම ඉදිරිපත් කළ යුතු අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අප සංස්ථාවෙන් නිර්දේශය ඉල්ලා ලිපියක් නිකුත් කිරීමෙන් පසුව පමණක් ඔබගේ ලිපිගොනුව පිළිබඳව කටයුතු කරනු ලැබේ.

සංවර්ධනය කිරීමට නියමිත ඔබගේ ඉඩමට අප ප්‍රධාන කාර්යාලයේ සිට දුර ප්‍රමාණය සහ ඉඩමේ විශාලත්වය අනුව, මෙම සංස්ථාව විසින් අයකිරීමක් කරනු ලැබේ. මෙසේ කරනු ලබන සේවා ගාස්තු වලින් ආපසු නොගෙවනු ලබන අත්තිකාරම් මුදලක් වශයෙන් රු. 3,000/= ක් , 2% ජා. ගො. බද්ද සහ 12%" වැට් බද්ද " එකතුව රු. 3, 428.50 ක මුදලක් අයදුම්පත භාරදෙන අවස්ථාවේදී ගෙවිය යුතුය.

කොළඹින් දුරබැහැර ප්‍රදේශ වල අයදුම්කරුවන්ගේ පහසුව පිණිස, "රාජගිරිය" තැපැල් හලින් මාරුකරගත හැකිවන පරිදි, " ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව " නමට ලියන ලද මුදල් ඇණවුම් භාරගනු ලැබේ. මුදලින් ගෙවීමේ දී සතියේ දිනවල ප.ව. 2.30 පෙර විශේෂ ව්‍යාපෘති අංශයට පැමිණිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

මුදල් ගෙවීමෙන් පසුව, ඒ සඳහා ලැබෙන කුවිතාන්සිය සමඟ අයදුම්පත සහ අදාල ලේඛණ විශේෂ ව්‍යාපෘති අංශය වෙත බාරදී, ඔබගේ ලිපිගොනුව සඳහා අංකයක් ලබාගත යුතුය. සංස්ථාව සමඟ මතුවට කෙරෙන ලිපි ගණුදෙනු වලදී, එම ලිපිගොනු අංකය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

ඔබගේ ලිපිගොනුව සම්බන්ධයෙන් කිසියම් විමසීමක් කළ යුතුව ඇත්නම්, ඒ සඳහා සතියේ දිනවල බදාදා අදාල නිලධාරීන් හමුවිය හැක.

ඉඩම් සංවර්ධනය සඳහා අවසර ඉල්ලීමේ දී අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා අදාල පළාත් පාලන ආයතනයේත්, (ප්‍රාදේශීය සභාව / නගර සභාව / මහ නගර සභාව), නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන් ඉදිරිපත් කරන්නේ නම්, එය ඔබගේ අයදුම්පත් සම්බන්ධව ඉක්මණින් කටයුතු කිරීමට පහසුවනු ඇත.